05190

OL/2016/16/S-I, II/(NEW)

[සියලු ම හිමිකම් ඇවිරිණි] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

16 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

ඉස්ලාම් I, II
இஸ்லாம் I, II
Islam I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## ඉස්ලාම් I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** නබි මුහම්මද් (සල්) තුමාට පළමු 'වහී' පහළ වූ ස්ථානය
(1) සෞ ය. (2) මර්වා ය. (3) හිරා ය. (4) සව්ර් ය.

**2.** මූඃමින්වරයකු විසින් ඉටු කළ යුතු කටයුතු අතර 'ඉමාරත්' යන්නෙන් අදහස් වන්නේ,
(1) අල්ලාහ්ගේ නියෝජිතයකු වශයෙන් ක්‍රියා කිරීම ය. (2) පොළොව සශ්‍රීක කිරීම ය.
(3) අල්ලාහ් නැමදීම ය. (4) අල්ලාහ්ගේ නීති ක්‍රියාත්මක කිරීම ය.

**3.** 'දුආඋල් ඉස්තිෆ්තාහ්' පාරායණය කරනු ලබන්නේ,
(1) අත්තහියියාතයෙන් පසුව ය. (2) රුකූහි සිට නැගිටි වහාම ය.
(3) සුජූදයෙන් පසුව මැද ඉඳුමේ දී ය. (4) තක්බීර් තහ්රීමයෙන් පසුව ය.

**4.** 'ඉල්හාද්' යන අරාබි පදයෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද?
(1) අදේවවාදය (2) වංචනිකත්වය (3) විශ්වාසය (4) ප්‍රතික්ෂේපය

**5.** පහත සඳහන් පද යුගලවලින් ඉතා ම සමීප, සමාන අර්ථයක් ඇත්තේ කුමන පද යුගලයේ ද?
(1) කල්බුන් සලීම් - කල්බුල් මුත්මඉන්නා (2) සහීහ් - ළඊෆ්
(3) මුජ්තහිද් - මුකල්ලිද් (4) දුන්යා - ආඛිරා

**6.** පහත සඳහන් අය අතුරින් 'අජ්නබි' වන්නේ කවුරුන් ද?
(1) බිරිඳගේ මව (2) කිරිමව (3) පුතාගේ බිරිඳ (4) නැන්දාගේ දුව

**7.** නීති ක්ෂේත්‍රයට අදාළ කරුණු සඳහන් වන කලාව
(1) ඉල්මුල් ෆරාඉල් ය. (2) ඉල්මුල් අකීදා ය. (3) ඉල්මුල් ෆික්හ් ය. (4) ඉල්මුන් නෆ්ස් ය.

**8.** තහනම් කර ඇති වෙළඳ කටයුත්තක් වන්නේ,
(1) අල්-මුලාරබා ය. (2) අල්-මුෂාරකා ය. (3) අල්-ඉජාරා ය. (4) අර්-රිබා ය.

**9.** සාලිම්, ධනය යොදා ගෙන කළ හැකි සුන්නත් වූ 'අමල්' ඉටු කිරීමට බලාපොරොත්තු විය. එම අවස්ථාවේ අසල්වැසි ගමේ ජනතාව ජල ගැල්මෙන් විපතට පත්ව අන් අයගේ උදව් උපකාර පතන තත්ත්වයක සිටියහ. පහත ප්‍රකාශවලින් සාලිම්ට මග පෙන්වන වඩාත් සුදුසු ප්‍රකාශය කුමක් ද?
(1) කණගාටු වන්න එපා. විපත් ස්වාභාවිකයි. ඔබගේ කැමැත්ත කරන්න.
(2) ඔබ ඔබගේ ධනය වියදම් කිරීම අනවශ්‍යයි. රාජ්‍ය නොවන ආයතන මෙයට මැදිහත් වෙයි. ඔබ අල්ලාහ්ගේ මාර්ගයේ යන්න.
(3) ඔබ කරන්නට යන්නේ සුන්නත් වූ කාර්යයකි. අපගේ සොහොයුරෝ විපතට පත්ව සිටිති. ඔබගේ ධනය යොදාගෙන එම ජනතාවට උදව් කරන්න.
(4) ඇත්තෙන් ම මෙය සංකීර්ණ ගැටලුවකි. ඔබගේ බිරිඳගේ සොහොයුරා ස්ථිර රැකියාවක් නැතිව සිටී. මෙම මුදල් ඔහුට දෙන්න. එවිට එම පවුලට උදව් කිරීමක් වන්නේ ය.

[ දෙවැනි පිටුව බලන්න

**10.** "මෙලොව ජීවිතය අර්ථයක් නැති විනෝදජනක ක්‍රීඩාවකි. ස්ථිර ජීවිතය පරලොව ජීවිතය වේ." මෙය,
(1) අල්-කුර්ආනයේ ප්‍රකාශයකි. (2) අල්-හදීස් ප්‍රකාශයකි.
(3) සහබාවරුන්ගේ ප්‍රකාශයකි. (4) ඉමාම්වරුන්ගේ ප්‍රකාශයකි.

**11.** පහත **'අ'** සහ **'ආ'** යටතේ දැක්වෙන්නේ හජ් වගකීම හා සම්බන්ධ වත්පිළිවෙත් කිහිපයකි.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) පිරිමින් හිස ආවරණය කිරීම | A - වාජිබ් |
| (ii) සිහි බුද්ධියෙන් යුතු ව සිටීම | B - ෆර්ලු |
| (iii) 'තවාෆුල් විදා' ඉටු කිරීම | C - මුහර්රමාත් |
| (iv) දුල්හජ් නවවැනිදා අරෆාවේ රැඳීම | D - ෂර්තු |

මෙහි **'ආ'** කොටස **'අ'** කොටස සමග ගැළපූ විට ලැබෙන නිවැරදි අනුපිළිවෙළ තෝරන්න.
(1) A, C, B, D (2) B, A, D, C (3) C, D, A, B (4) D, B, C, A

**12.** 'ඉක්ලාස්' යන පදයෙන් හැඟවෙන්නේ,
(1) පරෙස්සම් වීම ය. (2) නො බැඳුණු ජීවිතය ය. (3) පිරිසිදු චින්තනය ය. (4) දේව බිය ය.

**13.** පළමුව පහළ වූ අල්-කුර්ආන් වාක්‍ය ඇතුළත් සූරාව,
(1) අල්-අලක් ය. (2) අල්-කහ්ෆු ය. (3) අල්-බලද් ය. (4) අල්-බකරා ය.

**14.** 'ෆිත්රා' ඉටු කළ යුතු දිනය,
(1) ෂව්වාල් 1 වේ. (2) දුල්හජ් 10 වේ. (3) රජබු 27 වේ. (4) රමළාන් 27 වේ.

**15.** මම කවුද? පැමිණියේ කොහි සිට ද? වැනි ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දෙනුයේ,
(1) ඉන්ද්‍රියගත දැනුමෙනි. (2) විඥානයෙනි. (3) වහී දැනුමෙනි. (4) විද්‍යා දැනුමෙනි.

**16.** ව්‍යාපාරිකයෙක් තම ව්‍යාපාරය ආරම්භ කර අවුරුද්දක් අවසානයේ දළ වශයෙන් රු. 850 000/- ක් අත ඉතිරිව ඇති බව දැනගත්තේ ය. එම අවුරුද්දේ නිසාබය රුපියල් 450 000/- ක් විය. ඔහු විසින් ගෙවිය යුතු සකාත් ප්‍රමාණය කොපමණ ද?
(1) රු. 10 000/- කි. (2) රු. 11 250/- කි. (3) රු. 21 250/- කි. (4) රු. 42 500/- කි.

**17.** කිලාෆතුර් රාෂිදාවෙන් පසුව ඉස්ලාමීය පාලනය බාරගත්තේ,
(1) උමයියාවරුන් ය. (2) අබ්බාසිවරුන් ය. (3) උස්මානියවරුන් ය. (4) ෆාත්තිමීවරුන් ය.

**18.** ගැබිණි මවකගේ ඉද්දා කාලය කොපමණ ද?
(1) දරුවා ලැබෙන තෙක් ය. (2) මාස 4යි දින 10කි.
(3) මාස 3කි. (4) ඉද්දා නැත.

**19.** 'හනීෆ්වරු' යනු,
(1) අල්ලාහ්ට සම කිරීමෙහි නො යෙදුනු ජාහිලිය්‍යා යුගයේ විසූ අය ය.
(2) ස්වර්ගය හිමි වන බව පුරෝකථනය කරනු ලැබූවන් ය.
(3) හිජ්රතයට සහභාගී වූ අය ය.
(4) මජ්ලිසුස් සූරාහි සාමාජිකයන් ය.

**20.** නබි (සල්) තුමාගේ ජීවිත කතාව ප්‍රථමයෙන් ලියූවේ,
(1) ඉබ්නු ඉස්හාක් ය. (2) ඉබ්නු හිෂාම් ය. (3) ඉබ්නු කල්දූන් ය. (4) ඉබ්නු කල්ලිකාන් ය.

**21.** එක් අයෙකුට වැඩි කොටස්කරුවන් සහභාගී වන හවුල් ව්‍යාපාර හඳුන්වනු ලබන්නේ කෙසේ ද?
(1) මුලාරබා ලෙස (2) මුෂාරකා ලෙස (3) මුදාරආ ලෙස (4) මුරාබහා ලෙස

**22.** අකීදාව දෙස විශ්ලේෂණාත්මක දෘෂ්ටියෙන් ගවේෂණය කළ කණ්ඩායම
(1) අල්-මුඃතසිලාවරුන් ය. (2) අල්-මුර්ජිආවරුන් ය. (3) අෂ්-ෂීආවරුන් ය. (4) අල්-ජබරිය්‍යාවරුන් ය.

**23.** මිනිසකු විසින් අන් මිනිසුන්ට කළ යුතු යුතුකම්
(1) හක්කුල්ලාහ් නම්. (2) හක්කුන් නෆ්ස් නම්. (3) හක්කුල් ඉබාද් නම්. (4) හක්කුල් ජාර් නම්.

**24.** පහත සඳහන් ඒවායින් 'පරලොව දිනය' යන්න **නොදක්වන** පදය කුමක් ද?
(1) 'යව්මුල් ආඛිරා' (2) 'යව්මුන් නහ්ර්' (3) 'යව්මුල් කියාමා' (4) 'යව්මුද් දීන්'

**25.** අහමද් තම පියාට කෝප්පයකින් ජලය රැගෙන ආවේ ය. හදිසියේ ම තේ කෝප්පයක් රැගෙන එතැනට ආ ඔහුගේ සොහොයුරිය නසීමා සමග ඔහු ගැටුණු අතර ඇගේ අතේ වූ තේ අහමද් ගෙන ආ ජලයට මිශ්‍ර විය. දැන් එම ජලය හැඳින්විය හැක්කේ,
(1) 'අල් මාඋත් තාහිර්' ලෙස ය. (2) 'අල් මාඋත් තහූර්' ලෙස ය.
(3) 'අල් මාඋල් මුස්තෘමල්' ලෙස ය. (4) 'අල් මාඋන් නජිස්' ලෙස ය.

/ තුන්වැනි පිටුව බලන්න

26. අල්-කුර්ආනයේ 'තර්තීබුන් නුසූල්' යනු,
 (1) දැනට අල්-කුර්ආනය ගොනු කර ඇති පිළිවෙළ ය.
 (2) අල්-කුර්ආනය නබිතුමාට පහළ කරනු ලැබූ පිළිවෙළ ය.
 (3) අල්-කුර්ආනය පවසන නීති රීති ය.
 (4) අල්-කුර්ආනය වටහා ගැනීමට ඇති මාර්ගය ය.

27. 'තස්කියා' යන්නෙන් අදහස් කරනුයේ,
 (1) පරෙස්සම් වීම ය. (2) නො බැඳුණු ජීවිතය ය. (3) පිරිසිදු කිරීම ය. (4) පිරිසිදු සිතිවිලි ය.

28. පහත සඳහන් ඒවායින් නබි මුහම්මද් (සල්) තුමා හඳුන්වනු ලබන වාක්‍ය,
 (1) රබ්බුන්නාස් ය. (2) හුදන් ලින්නාස් ය.
 (3) රබ්බුල් ආලමීන් ය. (4) රහමතන් ලිල් ආලමීන් ය.

29. "කුල්හුවල්ලාහු අහද් .........." යන වාක්‍යය සහිත සූරාව හඳුන්වන නම
 (1) සූරතුල් කව්සර් ය. (2) සූරතු යූසුෆ් ය. (3) සූරතුල් ඉක්ලාස් ය. (4) සූරතුන්නාස් ය.

30. 'මහර්' යනු,
 (1) මනාලිය විසින් මනාලයාට කරනු ලබන පරිත්‍යාග ය.
 (2) මනාලයා විසින් මනාලියට කරනු ලබන පරිත්‍යාග ය.
 (3) උකසට තබන වස්තූන් ය.
 (4) නව යුවළට ලබා දෙන තෑගි ය.

31. නබි මුහම්මද් (සල්) තුමා තරුණ වියේ දී 'අල් අමීන්' යැයි හඳුන්වනු ලැබීමට හේතුව,
 (1) සත්‍ය කතා කිරීම ය. (2) සමාජ සේවාවල යෙදීම ය.
 (3) අනාථයකු ලෙස හැදී වැඩීම ය. (4) විශ්වාසවන්තව කටයුතු කිරීම ය.

32. පහත '**අ**' තීරුවේ කර්තෘවරුන් කිහිප දෙනකුගේ නම් ද '**ආ**' තීරුවේ ඔවුන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ කිහිපයක නම් ද දැක්වේ.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) ඉමාම් මාලික් (රහ්) | A - අර්-රිසාලා |
| (ii) ඉමාම් අහමද් (රහ්) | B - මුඅත්තා |
| (iii) ඉමාම් ෂාෆිඊ (රහ්) | C - අල්-ෆික්හුල් අක්බර් |
| (iv) ඉමාම් අබූ හනීෆා (රහ්) | D - මුස්නද් අහමද් |

ඉහත '**ආ**' තීරුවේ ග්‍රන්ථවල නම් '**අ**' තීරුවේ කර්තෘවරුන්ගේ නම්වලට අනුපිළිවෙළින් ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.
 (1) A, B, D, C (2) B, C, D, A (3) B, D, A, C (4) D, B, C, A

33. තයම්මුම්වලට අදාළ වන අවයව මොනවා ද?
 (1) මුහුණ සහ දෙපා (2) මුහුණ සහ දෑත් (3) මුහුණ සහ හිස (4) මුහුණ, හිස, දෑත් ආදිය

34. නබිතුමාගේ කාලයේ අරාබියේ නැගෙනහිර සීමාව
 (1) සිරියානු කාන්තාරය ය. (2) අරාබි මුහුද ය. (3) පර්සියානු බොක්ක ය. (4) රතු මුහුද ය.

35. විවාහය හැරුණු විට 'ඊජාබ් සහ කබූල්' සිදුවන තවත් අවස්ථාවක් වන්නේ,
 (1) රජයේ සේවය ය. (2) ගනුදෙනු ය. (3) ජනතා සේවය ය. (4) ගෘහ කර්මාන්ත ය.

36. 'අජ්නබි' වූ පිරිමියකු සමග කාන්තාවක තනියම සිටීම
 (1) මක්රූහ් ය. (2) ජාඉස් ය. (3) හරාම් ය. (4) මුස්තහබ් ය.

37. ඉස්ලාමයට වැදගත් වන සිද්ධස්ථාන තුනට අයත් **නො වන්නේ**,
 (1) කඃබතුල්ලාහ් ය. (2) මස්ජිදුල් අක්ෂා ය.
 (3) මස්ජිදුන් නබවි ය. (4) මස්ජිද් කිබ්ලතයින් ය.

38. ඊජිප්තුවෙන් ශ්‍රී ලංකාවට පිටුවහල් කරනු ලැබූ අයකු වන්නේ,
 (1) උමර් හසරත් ය. (2) කාලිද් බින් බකායා ය.
 (3) ඔරාබි පාෂා ය. (4) ඉබ්නු බතූදා ය.

39. කොළඹ සහිරා විද්‍යාලයේ විදුහල්පතිවරයකු වශයෙන් සහ දේශපාලකයකු වශයෙන් රටට සේවයක් කළ අයකු වන්නේ,
 (1) සිද්දි ලෙබ්බේ ය. (2) අයි. එල්. එම්. ඒ. අසීස් ය.
 (3) ආචාර්ය, ටී. බී. ජයා ය. (4) ඩබ්ලිව්. එම්. අබ්දුල් රහ්මාන් ය.

40. 'කලා-කද්ර්' පිළිබඳ ව **අවිශ්වාස** කරන්නා
 (1) ෆාසික් ය. (2) මුර්තද් ය. (3) මුනාෆික් ය. (4) කාෆිර් ය.

* *

[ හතරවැනි පිටුව බලන්න

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

16 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

ඉස්ලාම් I, II
இஸ்லாம் I, II
Islam I, II

## ඉස්ලාම් II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** කෙටි පිළිතුරු සපයන්න.

(i) වහීවල කොටස් **දෙක** නම් කරන්න.
(ii) සලාතය නිසා මුස්ලිම්වරයකුට ආරක්ෂා විය හැකි පව්වලින් **දෙකක්** සඳහන් කරන්න.
(iii) ඉස්ලාම් අනුමත කර ඇති ව්‍යාපාරික කටයුතු **දෙකක්** සඳහන් කරන්න.
(iv) අලි (රලි) තුමා සතුව පැවැති පෞරුෂ ලක්ෂණ **දෙකක්** ලියන්න.
(v) සලාතයේ දී පාරායණය මගින් ඉටු කරගන්නා වූ 'ෆර්ලු' **දෙක** නම් කරන්න.
(vi) අබුබක්ර් (රලි), උස්මාන් (රලි) යන කලීෆාවරුන් අල්-කුර්ආනය ගොනු කිරීමට පෙලඹවූ සහාබිවරු **දෙදෙනා** කවුරුන් ද?
(vii) ජාහිලිය්‍යා කාලීන ජනයා සුරැකි යහගුණ **දෙකක්** සඳහන් කරන්න.
(viii) 'ඊජාබ්' සහ 'කබූල්' යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද?
(ix) ඉජ්මාවේ ප්‍රධාන ආකාර **දෙකක්** සඳහන් කරන්න.
(x) ධනය ඉපැයීමේ දී සැලකිලිමත් විය යුතු ෂරීආ ක්‍රම **හතරක්** දක්වන්න.

**2.** (i) 'අහ්ලුස්සුන්නා වල් ජමා අත්' යන්නෙන් කුමක් අදහස් වේ ද?
(ii) ඉල්මුල් අකීදාව බිහි වීමට හේතු වූ පසුබිම සඳහන් කරන්න.
(iii) නොමග ගිය අකීදා කණ්ඩායම් පිළිබඳ විස්තරයක් කරන්න.

**3.** (i) මක්කාවෙහි නබි (සල්) තුමා දඃවා කටයුතු ඉටු කරන අවස්ථාවේ එතුමාගේ සහායට සිටි අය කවුරුන් ද?
(ii) නබි (සල්) තුමාගේ දඃවා කටයුතුවලට කුරයිෂිවරුන් බාධා පැමිණවූ ආකාරය පැහැදිලි කරන්න.
(iii) දෙවැනි අකබා ගිවිසුම පිළිබඳ විස්තර කරන්න.

**4.** (i) 'ෆික්හුල් අව්ලවිය්යාත්' යන්නෙහි අර්ථය කුමක් ද?
(ii) ඉස්ලාම් ලබා දී ඇති මිනිස් අයිතිවාසිකම්ල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ ගෙනහැර දක්වන්න.
(iii) එදිනෙදා ජීවිතයේ ඇති විය හැකි ගැටලුකාරී අවස්ථාවක් දක්වා, එවැනි අවස්ථාවක දී ප්‍රමුඛත්වය දිය යුතු ක්‍රියාකාරකම් පිළිබඳව පැහැදිලි කරන්න.

**5.** (i) "දුආව නැමදුමකි." මෙහි අර්ථය කුමක් ද?
(ii) සුබහු සලාතයෙන් පසුව පාරායණය කළ යුතු යැ'යි නබිතුමා ඉගැන්වූ 'දුආ' **තුන** සඳහන් කරන්න.
(iii) තස්බීහ්, තහ්මීද්, තක්බීර් යන පද පැහැදිලි කරන්න.

**6.** (i) 'උම්මත්' යන පදයේ තේරුම ලියන්න.
(ii) පවුලේ නෑකම් තුළින් ඇති වන 'මහ්රම්' පිළිබඳ ව පැහැදිලි කරන්න.
(iii) අජ්නබිවරුන් සමග කතාබස් කරන විට පිළිපැදිය යුතු විධි ක්‍රම විස්තර කරන්න.

**7.** පහත සඳහන් ඒවායින් **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ජලයේ ආකාර හා ඒවායේ භාවිත
(ii) ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ජාතික දායකත්වය
(iii) පරිත්‍යාගයේ ප්‍රයෝජන
(iv) මධ්‍යස්ථභාවය අනුගමනය කිරීම (වසතිය්‍යා)

* * *

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත්

# ගෙදරටම ගෙන්වා ගන්න

# ඔන්ලයින් ඕඩර් කරන්න

www.store.pastpapers.wiki

# වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA DISCOVER NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE

An evening of fun for young readers

